(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 3(3).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2019 අගෝස්තු 09 වැනි සිකුරාදා**

---

## 2019 අගෝස්තු 20 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන්ට ගෙවනු ලබන වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අතර 108(2) ව්‍යවස්ථාව මඟින් එකී විනිශ්චයකාරවරයන් පත්කිරීමෙන් පසුව ඔවුන්ට ගෙවිය යුතු වැටුප් හෝ විශ්‍රාම වැටුප් හිමිකම් අඩු නොකළ යුතු බවට විධිවිධාන සලසා ඇති හෙයින් ද;

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 25 වැනි වගන්තිය සංශෝධනය කරනු ලැබූ අංක 1190/18 දරන හා 2001.06.28 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු හෝ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙකු විශ්‍රාම ගැන් වූ විට, විශ්‍රාම යන අවස්ථාවේ ලැබූ වැටුපෙන් 90%ක් විශ්‍රාම වැටුප ලෙස ලැබීමට හිමිකම් ලැබී ඇති හෙයින් ද;

උපරිමාධිකරණ විනිශ්චයකාරවරයන් තම මනාපය පළ කිරීම මත ඔවුන්ට හිමි මාසික විශ්‍රාම වැටුප මෙන් 24 ගුණයක දීමනාවක් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ලෙස ලබා ගත හැකි අතර දීර්ඝ කාලයක් තුළ මෙම පාරිතෝෂිකය විශ්‍රාම වැටුපෙන් අඩු නොකර මුළු විශ්‍රාම වැටුපම මාසිකව ගෙවීම සිදුකර ඇති හෙයින් ද; ජනාධිපතිවරයා විසින් 2019 ජූනි 24 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ 2019 ජූලි 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පදනම් කර ගනිමින් මෙම පාරිතෝෂිකය ලබා ගැනීමට මනාපය පළ කිරීම මත එකී පාරිතෝෂිකය නැවත රජයට අයකර ගනු ලබන ක්‍රමයට එකඟ වීම ද අර්ථ ගන්වා ඇති බැවින් අත්තිකාරම් මුදලක් වශයෙන් උපරිමාධිකරණ විනිශ්චයකාරවරයෙකුට ලබා දුන් පාරිතෝෂික මුදල් වසර 10ක් හෙවත් මාසික වාරික 120කින් නැවත අයකර ගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(2) ව්‍යවස්ථාව උල්ලංඝනය නොකරන හෙයින් ද;

ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම වැටුප අඩුවීම හෝ ඊට අනුෂාංගික කරුණු කෙරෙහි බලපාන සියලු කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට පැවරී ඇති බව නීතිපතිවරයා විසින් පෙන්වා දෙනු ලැබ ඇති හෙයින් ද;

එසේම මෑතක දී අධිකරණ ක්ෂේත්‍රයට ඉතා ඉහළ වැටුප් වැඩි කිරීමක් සිදු කර ඇති බවද සැලකිල්ලට ගෙන ඇති හෙයින් ද;

ඊට අනුකූලව, උපරිමාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය පවත්නා නීතියට අනුකූලව, මාස 120 කින් ආපසු අය කර ගැනීමට මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව 2019.04.26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න මහතා විගණකාධිපතිවරයා වශයෙන් පත්කර ඇති හෙයින්ද;

විගණකාධිපතිවරයාගේ වැටුප 153(2) ව්‍යවස්ථාව අනුව, පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන අතර ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින් ද;

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින්, 2019 ජූනි 24 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට 2019 ජූලි 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න මහතාට 2019.04.26 දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි SL – 4 වැටුප් ක්‍රමයෙහි 7 පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවීම හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අනුව තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමටත් එම වැටුප් පරිමාණයට අනුව වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමටත් අනුමතිය ලබා දී ඇති හෙයින්ද;

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව අනුව, විගණකාධිපති ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න මහතා වෙත ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවනවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග (අංක 1),— 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 52(2) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 58 වගන්තිය යටතේ තීරකවරයන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 08 දිනැති අංක 2113/63 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.08.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග (අංක 2),— 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 53(2) සහ 54(1)(අ) වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 58 වගන්තිය යටතේ අභියාචනා කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 28 දිනැති අංක 2116/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.08.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග (අංක 3),— 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 55(2) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 58 වගන්තිය යටතේ තොරතුරු ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 28 දිනැති අංක 2116/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.08.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝග,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 29(2)(ඇ) වගන්තිය යටතේ අපනයනකරුවන් ලියාපදිංචි කිරීමේ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අප්‍රේල් 11 දිනැති අංක 2118/60 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.08.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015/2016),— 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2018.08.08 දින ඉදිරිපත් කරන ලද, 2016.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.07.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016),— 1979 අංක 45 දරන ජාතික වැවිලි කළමනාකරණ පනතේ 23 වැනි වගන්තිය යටතේ 2018.08.08 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.05.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ 14 - 1A වගන්තිය යටතේ 2018.05.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.05.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016),— ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ 14 - 1A වගන්තිය යටතේ 2018.09.19 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.05.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වැනි වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ II කොටසට අනුව 2019.06.20 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.07.23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2018.01.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.06.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2018.07.19 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.06.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය යටතේ 2018.06.20 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.07.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016/2017),— 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED 12, පරිච්ඡේද අංක 6.5.3 යටතේ 2018.06.21 දින ඉදිරිපත් කරන ලද, 2017.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.01.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වැනි වගන්තිය යටතේ 2018.08.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.01.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වැනි වගන්තිය යටතේ 2018.09.18 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.03.16 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016),— 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ 27 වැනි වගන්තිය යටතේ 2018.09.18 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.03.16 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2018.10.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.03.16 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වැනි වගන්තිය යටතේ 2019.05.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.07.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2018.07.20 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.06.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2017.11.25 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.06.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2018.10.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.06.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2019.01.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2019.06.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2019 සැප්තැම්බර් 06 වැනි සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 11 /’18

ගරු වජිරාද විජේසිරි මහතා,— ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල් ඉතා අඩු ආර්ථික මට්ටමක පවතින බැවින්, එවැනි පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කිරීම,— රටක සංවර්ධනය සඳහා තොරතුරු වැදගත් සාධකයක් වන අතර, එම තොරතුරු සම්පාදනයේදී වැදගත් මෙහෙවරක් ඉටුකරන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— හජ් වන්දනා පනතක් හඳුන්වා දීම,— වාර්ෂිකව හජ් වන්දනාවේ යෙදෙන ශ්‍රී ලාංකික බැතිමතුන් විසින් මුහුණ දෙන ගැටලු නිරාකරණය කර ගැනීමටත්, ඒ පිළිබඳ ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කොට නීතිමය ප්‍රතිපාදන සකස් කිරීමටත්, රජය මඟින් "හජ් වන්දනා පනතක්" හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කයේ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය භූගෝලීය වශයෙන් සලකා බලන කල මුහුදු සීමාවෙන් දුරස්ථව පිහිටා ඇති බැවින්, එම දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාලීම සඳහා මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලු වැව් හා ජලාශවල මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කය තුළ පයිනස් වගාව හේතුවෙන් සිදුවී ඇති පරිසර හානිය අවම කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ පයිනස් වගාව හේතුවෙන් පරිසරයට දැඩි හානියක් සිදුවී ඇති බැවින්, එම පරිසර හානිය අවම කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා, — මහනුවර රෝහල් පරිශ්‍රයේ ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම,— යහපාලන රජය යටතේ මහනුවර රෝහල දෙවැනි ජාතික රෝහල ලෙස දියුණු කිරීමට පියවර ගනිමින් සිටින බැවින්, එම රෝහල් පරිශ්‍රයේ ඇති සියලු අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කඩිනමින් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අයහපත් කාලගුණය නිසා ඇතිවන වසංගත තත්ත්වයන් ව්‍යාප්තවීම වැළැක්වීම,— අයහපත් කාලගුණය නිසා ඇතිවන ජල ගැලීම් වලින් පසුව ආපදාවට ලක්වූ ප්‍රදේශවල ජලය බැස යාමත් සමඟ මී උණ, පාචනය ඇතුළු බෝවන රෝග පැතිරයාමේ අවදානමක් පවතින බවට අදාළ ප්‍රදේශවල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් පෙන්වා දී ඇති බැවින්, එවැනි වසංගත තත්ත්වයන් ඇතිවීම වැළැක්වීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— ගංගා ද්‍රෝණි පද්ධතියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම,— කෘෂිකාර්මික රටක් වන අප රටෙහි ගංගා ද්‍රෝණි පද්ධතියෙන් කෘෂි කර්මාන්තයට විශාල සේවාවක් ඉටුවන නමුදු, මෙම ගංගාවල ජලයෙන් විශාල ප්‍රමාණයක් භාවිතයට නොගෙන මුහුදට ගලා බසින බව විද්වත් පර්යේෂණ මඟින් පවා හෙළි වී ඇති බැවින්, මහා පරාක්‍රමබාහු රජ සමයේදී මෙන් මෙම ජල සම්පතෙන් රටේ සංවර්ධනයට උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි ආකාරයේ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම,— මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාවට දක්ෂතා දක්වන විශාල පිරිසක් සිටින බැවින් එම පිරිස ජාත්‍යන්තර තලයට ගෙන යාමට හැකිවන අයුරින් මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාව ප්‍රවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය සතුව තිබූ වොලිබෝල් ක්‍රීඩාවේ අභිමානය නැවත ගොඩනැගීමට වැඩසටහනක් දියත් කිරීම,— මීට දශකයකට පමණ පෙර පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල් වලින් බිහිවූ දක්ෂ වොලිබෝල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තරඟ වලදී දැක්වූ දක්ෂතා නිසා පුත්තලම දිස්ත්‍රික්කයට වොලිබෝල් ක්‍රීඩාවෙන් ඉතා අභිමානවත් ස්ථානයක් හිමි වුවද, අද වනවිට එම තත්ත්වයේ යම් බිඳ වැටීමක් ඇති බැවින්, නැවත එම අභිමානය පුත්තලම දිස්ත්‍රික්කයට ගෙන ඒමට වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීම,— ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රෝටීන් ලබාදීමටත්, වාර්ෂිකව ටින් මාළු ආනයනය වෙනුවෙන් විදේශ රටවල් කරා ඇදී යන විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා මෙන්ම, ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය සියලුම සම්පත් පුත්තලම දිස්ත්‍රික්කය තුළ පවතින බැවින් ද, එම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කිරීම,— රටක සංවර්ධනය සඳහා අධිවේගී මාර්ග ඉතා වැදගත් වන බැවින් ද, යහපාලන රජය යටතේ පුත්තලම දිස්ත්‍රික්කය ඉතා වේගයෙන් සංවර්ධනය වන බැවින් ද, එම සංවර්ධන වේගය තවදුරටත් ඉහළ නැංවීම සඳහා දැනට කොළඹ සිට කටුනායක දක්වා වූ අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා, — වයඹ පළාතේ වැව්, ගංගා සහ ඇළ මාර්ග ආශ්‍රිතව කුඹුක් ශාඛ සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම,— පසේ පවතින ජලය ආරක්ෂා කිරීමේ හැකියාව මෙන්ම, පාංශු ඛාදනය අවම කිරීමේ ගුණාංග සහිත වූ දිගු ආයු කාලයක් ඇති කුඹුක් ශාඛ, වයඹ පළාතේ වැව්, ගංගා සහ ඇළ මාර්ග ආශ්‍රිතව සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— බත්තලංගුණ්ඩුව දූපත්වාසී ධීවර ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා කඩිනම් පියවර ගැනීම,— වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය අර්ධද්වීපය අසල ඇති ප්‍රධාන දූපතක් වන බත්තලංගුණ්ඩුව දූපතේ ධීවර ප්‍රජාවගේ මූලික අවශ්‍යතා පිළිබඳව මෙතෙක් නිසි අවධානයට ලක් නොවී ඇති බැවින්, යහපාලන රජය යටතේ එම ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරා දී ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා කඩිනම් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය තුළ ජලජ පැළෑටි වගා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම,— වර්තමානයේ ලෝකයේ ජලජ පැළෑටි සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර, එමඟින් අපේ රටට විදේශ විනිමය උපයා ගැනීමේ පුළුල් අවස්ථාවක් උදා වී ඇති අතර, මෑතකදී ජපන් විශේෂඥයන් විසින් සිය පර්යේෂණ වාර්තාවක ජලජ පැළෑටි වගාව සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය ආශ්‍රිත ප්‍රදේශය ඉතා යෝග්‍ය බව පෙන්වා දී ඇති පසුබිමක ජලජ පැළෑටි වගා කිරීමේ ව්‍යාපෘතියක් පුත්තලම දිස්ත්‍රික්කය තුළ ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වයඹ පළාත තුළ පිළිකා රෝහලක් ස්ථාපිත කිරීම,— වයඹ පළාත තුළ මේ වනවිට පිළිකා රෝගීන් සංඛ්‍යාව විශාල ලෙස ඉහළ ගොස් ඇති බැවින්, එම රෝගී ජනතාව වෙනුවෙන් වයඹ පළාත තුළ පිළිකා රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වයඹ පළාත තුළ ළමා රෝහලක් ස්ථාපිත කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ළමා රෝහල වන රිජ්වේ ආර්යා ළමා රෝහලේ පවතින ඇඩි තදබදය අවම කිරීම සඳහා මෙන්ම, වයඹ හා උතුරු මැද පළාතේ ජනතාවට ප්‍රයෝජනවත් වන පරිදි වයඹ පළාත තුළ ළමා රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කයේ හෝටල් පාසලක් ස්ථාපිත කිරීම,— යහපාලන රජය යටතේ පුත්තලම දිස්ත්‍රික්කය සංචාරක කලාපයක් ලෙස දියුණු කිරීමට අපේක්ෂා කරන බැවින්, එම කර්මාන්තයේ දියුණුව සඳහා අවශ්‍ය මානව සම්පත පුහුණු කිරීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ හෝටල් පාසලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා, — කල්පිටිය ආශ්‍රිතව තල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම,— වයඹ පළාතේ කල්පිටිය ප්‍රදේශයේ තල් ආශ්‍රිත කර්මාන්ත පසුගිය වසර කිහිපය තුළ දරුණු කඩා වැටීමකට ලක් වී ඇති බැවින්, වත්මන් රජයේ ප්‍රතිපත්තිවලට අනුව, ඉදිරියේදී කල්පිටිය ප්‍රදේශය සංචාරක පුරවරයක් වශයෙන් සංවර්ධනය කිරීමේ වැඩසටහනට සමගාමීව එම ප්‍රදේශයේ තල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් ද දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නවත්වාලීම,— ශ්‍රී ලංකාව අතීතයේ පටන්ම සත්ව කරුණාව පතුරුවාලන බෞද්ධ රටක් වුවද, අද වනවිට සමහර කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නිසා සතුන් දැඩි හිංසාවකට ලක්වීමත්, අධික බිත්තර නිෂ්පාදනය තුළින් සුළු පරිමාණ කුකුළු ගොවිපළ හිමියන්ගේ රැකියා අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇති බැවින්, මෙම අති අමානුෂීය ක්‍රමය නවත්වාලීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වාර්ෂිකව කිරි පිටි ආනයනය සඳහා විශාල මුදලක් වැයවන අතර එම මුදල් අප රට තුළම ඉතිරි කරගත හැකිනම්, එය රටේ ආර්ථිකයට විශාල පිටුබලයක් වන බැවින්, කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාත තුළ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය ඉතා ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන රැසක් සහිත දිස්ත්‍රික්කයක් වන අතර අතීතයේදී කුරුණෑගල, දඹදෙණිය සහ යාපහුව වැනි රාජධානි පිහිටා තිබුනේද කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වුවත්, අද වනවිට එම පෞරාණික ස්ථානවල ආරක්ෂාව සම්බන්ධයෙන් බලවත් ගැටලු මතුවී ඇති බැවින්, එම පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම,— ඕනෑම රටක සාර්ථක සමාජ ආරක්ෂණ ජාලයක් පැවතීම එම රටේ ජීවත් වන පුරවැසියන්ට වැදගත් වන අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ අර්ථ සාධක ක්‍රමයක් ක්‍රියාත්මක වුවද, රටේ අවිධිමත් අංශයේ සේවකයන් සඳහා කිසිදු සමාජ ආරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක නොවන බැවින්, සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාත තුළ වකුගඩු රෝගීන් සඳහා රෝහලක් ස්ථාපිත කිරීම,— වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ මෑත කාලීනව විශාල ලෙස වකුගඩු රෝගය පැතිරීම ඉහළ ගොස් ඇති බැවින්, එම රෝගීන් වෙනුවෙන් වයඹ පළාත තුළ රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තැලසීමියා රෝගීන් සඳහා රෝහලක් ස්ථාපිත කිරීම,— මෑතකාලීනව ශ්‍රී ලංකාවේ වැඩිම තැලසීමියා රෝගීන් වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන අතර, තවමත් එම රෝගීන්ට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වෙනම රෝහලක් ස්ථාපිත කර නොමැති බැවින්, එම රෝගීන් සඳහා වෙනම රෝහලක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ ගරා වැටෙමින් තිබෙන විහාරස්ථාන සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ වැඩිම විහාරස්ථාන සංඛ්‍යාවක් පිහිටා ඇති, ස්වාමීන්වහන්සේලා වැඩිම ප්‍රමාණයක් වැඩ සිටින, බෞද්ධයන් වැඩිම පිරිසක් වාසය කරන හා ශාසනාරක්ෂක බල මණ්ඩල වැඩිම සංඛ්‍යාවක් ක්‍රියාත්මකව පවතින වයඹ පළාතෙහි ගරා වැටෙමින් තිබෙන විහාරස්ථාන සංවර්ධනය කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 37/'19

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වූ පවුල් සඳහා සහන සලසාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා භූගත උමං මාර්ග කැණීම හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ ජනතාවට සිය නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වී මේ වනවිට වසර තුනක කාලයක් ගතවී තිබුණ ද, අවතැන් වූ එම ජනතාවට මෙතෙක් කිසිදු වන්දි මුදලක් හෝ සහනයක් ලැබී නොමැති බැවින්, එම ජනතාවට සහන සලසා දීමේ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 38/'19

ගරු හේෂා විතානගේ මහතා,— දුම්රිය මඟින් එළවළු ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම,— බදුල්ල දිස්ත්‍රික්කය ඇතුළු එළවළු නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කවල සිට එළවළු ගොවීන්ගේ නිෂ්පාදන අඩු පිරිවැයකින්, අපතේ යෑම අවම කරමින් දුම්රිය මඟින් රටේ සෙසු ප්‍රදේශවල වෙළෙඳපොළ වෙත ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/'19

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ජල හිඟයකට මුහුණ දී සිටින ජනතාවට ජල පහසුකම් ලබාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07ක පවුල් 8394ක ජනතාවට උග්‍ර ජල හිඟයකට මුහුණ පෑමට සිදුවී ඇති බැවින්, එම ජනතාවට අවශ්‍ය ජල පහසුකම් ලබාදීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/'19

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම,— අයහපත් කාලගුණය සහිත කාලසීමාවන්වලදී නිරන්තරයෙන්ම ගංවතුරින් ආපදාවට ලක්වන රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීමට වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/'19

ගරු හේෂා විතානගේ මහතා,— අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කිරීම,— කලාව, ක්‍රීඩාව ආදී බොහෝ අංශවල සබරගමුවට උරුම ආවේණික ලක්ෂණ ඇති අතර අද වනවිට වාණිජකරණය හමුවේ එම ආවේණික ලක්ෂණ අභාවයට යාමේ අවදානමක් ඇති බැවින්, අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කර ගැනීමේ වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/'19

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා අවම කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නිකුත් කරන ලද වාර්තාවන්ට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා තත්ත්වයන්ට ලක්වීමේ අවදානමක් සහිත ස්ථාන රාශියක් ඇති බව පෙන්වා දී ඇති බැවින්, එම තත්ත්වයන් අවම කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/'19

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— අන්තර්ජාලය තුළ අසභ්‍ය වීඩියෝ පට සංසරණය වීම වැළැක්වීමෙහිලා විශේෂ ඒකකයක් පිහිටුවීම,— වර්තමානයේ බහුල වශයෙන් අන්තර්ජාලය ඔස්සේ නොයෙකුත් අසභ්‍ය වීඩියෝ දර්ශන සංසරණය වීම මඟින් පුද්ගලයන්ගේ පුද්ගලිකත්වය විනාශවන අතර විශේෂයෙන්ම, කාන්තා පාර්ශ්වය එමඟින් විශාල අපහසුතාවයකට පත්වන බැවින්, මෙවන් වීඩියෝ දර්ශන ළඟ තබාගෙන සිටින, බෙදා හරින හා නිර්මාණය කරන පුද්ගලයන් පිළිබඳව විමර්ශනය කිරීමට ප්‍රතිඵලදායී විශේෂ ඒකකයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/’19

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— විශ්වවිද්‍යාල හා අනෙකුත් සියලුම උසස් අධ්‍යාපන ආයතනවලට විශේෂ පුහුණුවලත් මානසික උපදේශකවරු හෝ අනුශාසකවරු පත්කිරීම,— වර්තමානයේ බහුල වශයෙන් දක්නට ලැබෙන තරුණ තරුණියන්, සිසු සිසුවියන් සියදිවි හානිකර ගැනීමේ ප්‍රවණතාවය මැඩපැවැත්වීම සඳහා සියලුම රජයේ අධ්‍යාපන ආයතන සඳහා පුහුණුවලත් මානසික උපදේශකවරු, අනුශාසකවරු හෝ එම අධ්‍යාපන ආයතනවල දැනට සිටින ගුරුවර ගුරුවරියන්ට මානසික උපදේශනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 45/’19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මොරටුව විශ්වවිද්‍යාලය සඳහා යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස නාගොඩ මහ රෝහල සංවර්ධනය කිරීම,— 2018 අයවැය මඟින් මොරටුව විශ්වවිද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය පීඨයක් ඉදිකිරීමට යෝජනා කර ඇති අතර එම යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස නාගොඩ මහ රෝහල සංවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 46/’19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ඨ සම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්දනය කිරීම හා ස්වයං විනයක් ඇති කිරීම උදෙසා සියලුම දරුවන්ට, 9 ශ්‍රේණිය දක්වා ඔවුන්ගේ ආගමට අනුකූල දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 47/’19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— කොළොන්නාව මහ නගර සභාව ස්ථාපිත කිරීම, — කොළඹ නගරය සහ එහි තදාසන්න නගර පරිපාලනය සඳහා කොළඹ, කඩුවෙල සහ කෝට්ටේ යනුවෙන් මහ නගර සභා තුනක් පැවතිය ද, මෙම මහ නගර සභා බල ප්‍රදේශ තුනටම මායිම්ව ඇති කොළොන්නාව මැතිවරණ කොට්ඨාසය පාලනය වන්නේ ප්‍රාදේශීය පරිපාලන ඒකක දෙකක් වන කොළොන්නාව නගර සභාව සහ කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව යටතේ වන බැවින්, සමස්ත කොළොන්නාව මැතිවරණ කොට්ඨාසයේම ආර්ථික, සමාජයීය හා සංස්කෘතික විෂමතාවන් ඇති කිරීමට මෙය හේතු වී ඇති අතර, අවට පවතින මහ නගර සභා, පරිපාලනයේ කාර්යක්ෂමතාව මත ශීඝ්‍ර සංවර්ධනයක් මේ වනවිට ළඟා කර ගෙන ඇති බැවින්, සමස්ත කොළොන්නාව මැතිවරණ කොට්ඨාසයේම සංවර්ධනය අරමුණු කර ගනිමින් කොළොන්නාව නගර සභාව සහ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව එකාබද්ධ කර කොළොන්නාව මහ නගර සභාව ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/’19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— බුලත් වගාව නඟා සිටුවීම,— ගම්පහ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල විශාල පිරිසකගේ ජීවනෝපාය වන බුලත් වගාව, රටට විදේශ විනිමය ගෙන එන කෘෂිකාර්මික බෝගයක් වන අතර, ශ්‍රී ලංකාවෙන් බුලත් මිලදී ගන්නා ප්‍රධාන රටක් වන පාකිස්ථානය මෑතකදී එරටට ආනයනය කරන බුලත් සඳහා පනවන ලද බදු මෙන්ම, වගාවට දේශීයව බලපාන්නා වූ කරුණු ගණනාවක් හේතු කොට ගෙන දේශීය බුලත් මිල ඉතාමත් පහළ මට්ටමකට වැටී ඇති පසුබිමක බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ කටයුතු ද අක්‍රමවත් වී ඇති බැවින්, මෙම තත්ත්වයන් හමුවේ අසීරුතාවයට පත්වී සිටින බුලත් ගොවීන් නඟා සිටුවීමටත්, අවශ්‍ය අපනයන දිශාවන් සොයා ගැනීමටත් අවශ්‍ය රාජ්‍ය මැදිහත් වීම වඩා කාර්යක්ෂම කිරීම මඟින් බුලත් වගාව නඟා සිටුවීම සඳහා පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 50/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ණය තොරතුරු කාර්යාංශය මඟින් අසාදු ලේඛනගත ඇපකරුවන් එම ලේඛනයෙන් නිදහස් කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වාණිජ බැංකු මඟින් රටේ පුරවැසියන්ට විවිධ වූ අවශ්‍යතාවයන් සඳහා ණය ලබා දීමේදී දේපළ ඇප මෙන්ම, පුද්ගල ඇප ද තබා ගන්නා අතර මෙහිදී ඇපකරු ණයගැතියා වෙත සිදුකරන්නේ උපකාරයක් වුවත්, යම් හෙයකින් ණයගැතියා ණය ගෙවීම පැහැර හැරියහොත්, ණයගැතියා ඇතුළුව ඇපකරුවන්ගේ නම් ද ණය තොරතුරු කාර්යාංශය මඟින් අසාදු ලේඛනයට ඇතුළත් කිරීමෙන් ඇපකරුට බලවත් අසාධාරණයක් සිදුවන අතර ගනුදෙනුව සමථයකට පත්වන තුරු ඇපකරුට බැංකු ණයක් ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් හමුවේ රටේ නව ව්‍යවසායකයන් බිහිවීමට මෙන්ම, දළ ජාතික නිෂ්පාදිතයට ද අහිතකර ලෙස බලපෑම් සිදුවිය හැකි බැවින් ඇපකරුවන් සම්බන්ධයෙන් ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කර ණය තොරතුරු කාර්යාංශය මඟින් අසාදු ලේඛනගත ඇපකරුවන් එම ලේඛනයෙන් නිදහස් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 51/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන උසස් ප්‍රමිතියකින් යුතුව පවත්වා ගෙන යෑමේ අරමුණින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට සංශෝධන හඳුන්වා දීම,— ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන විශාල වශයෙන් පිහිටුවීමේ ප්‍රවණතාවයක් ඇති අතර ක්‍රමවත් අධ්‍යාපනය රටක සංවර්ධනයට උපකාරී වන බැවින්, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල බිහිවීම පැති කිහිපයකින්ම රටට හිතකර වන නමුත් මෙම ආයතනවලින් ලබාදෙන සේවාවේ ගුණාත්මකභාවය ආරක්ෂා වන පරිදි පිළිගත් ප්‍රමිතියකින් යුතුව ලබාදීම ඉතා වැදගත් බැවින් පළපුරුදු විද්වතුන්ගේ හා අධ්‍යාපනඥයන්ගේ මැදිහත් වීම තුළින් අදාළ පාඨමාලාවල අන්තර්ගතය විමසුමකට ලක්කරමින් පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලින් සිදුවන සේවාව උසස් ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා දැනට පවතින නීති පද්ධතිය ශක්තිමත් නොවන හෙයින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට සංශෝධන හඳුන්වා දීම කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 52/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— පෞද්ගලික මූල්‍ය ආයතන පවත්වාගෙන යාමට අදාළ පනත් සංශෝධනය කිරීම තුළින් තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම,— පෞද්ගලික මූල්‍ය ආයතනවල මුදල් තැන්පත් කිරීමේදී තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතුවන අවස්ථා ඇති බැවින්, තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව තහවුරු වන පරිදි මූල්‍ය සමාගම්වල ව්‍යාපාරික කටයුතු සිදුකර ගෙන යාමට ප්‍රමාණවත් නීති ප්‍රතිපාදන ශක්තිමත් නොවන හෙයින්, 2007 අංක 7 දරන සමාගම් නීතිය සංශෝධනය කොට බුන්වත් නීතිය ශක්තිමත් කිරීම කඩිනමින් සිදුකර ඊට සහාය සඳහා 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත, 2011 අංක 1 සහ 19 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් සංශෝධනය කිරීම තුළින් රට තුළ ශක්තිමත් මූල්‍ය අංශයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නිසි ප්‍රමිතියෙන් යුතුව සුළු අපනයන බෝග නිෂ්පාදනය කිරීම,— සුළු අපනයන බෝග නිෂ්පාදනය නිසි ප්‍රමිතියෙන් තොරව සිදුකිරීම මඟින් වගාකරුවන්ට මෙන්ම, රටට ද අහිතකර ලෙස බලපෑම් ඇතිවන අතර, රජයේ ආදායම වැඩිකර ගැනීම සඳහා අපනයන වැඩිකර ගැනීම උපකාරී වන නමුත්, ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝගවලට ජාත්‍යන්තරයේ තිබූ ඉහළ කීර්ති නාමය ගොරකාවලට යූරියා මිශ්‍ර කිරීම වැනි කූට ක්‍රම හේතුවෙන් පළුදු වී ඇති අතර මෙරට නිෂ්පාදිත සුළු අපනයන බෝග සඳහා ඇති විදේශීය ඉල්ලුම අඩුවීමෙන් දේශීය මිල ද පහත වැටී ඇති පසුබිමක මෙම තත්ත්වය වහා වෙනස් කර නිෂ්පාදනය කරන සුළු අපනයන බෝගවල ප්‍රමිතිය ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 54/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ව්‍යවසායකත්ව බැංකු ක්‍රමය හඳුන්වාදීම සහ ස්ථාපිත කිරීම,— දිවයිනේ ඇති වාණිජ බැංකු මඟින් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන් දිරිගැන්වීමෙහිලා ලබා දෙන මූල්‍ය අනුග්‍රහය ප්‍රමාණවත් නොවන බැවින් ලෝකයේ දියුණු රටවල භාවිතා වන ව්‍යවසායකත්ව බැංකු ක්‍රමය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම මඟින් නව ව්‍යවසායකයන් බිහිවීමේ ප්‍රවණතාවය ඉහළ යා හැකි අතර නව අදහස් සමඟ බැංකුවට පැමිණෙන තරුණ ව්‍යවසායකයන්ගේ අවශ්‍යතාව තේරුම් ගෙන ඔවුනට මූල්‍ය පහසුකම් පමණක් නොව ව්‍යාපාරික දැනුම හා නිරන්තර රැකවරණය ලබා දීම මෙම බැංකු ක්‍රමයේ ඇති විශේෂතා වන අතර, එමඟින් රැකියා උත්පාදනය සමඟ ජාතික නිෂ්පාදිතය වැඩිවීමෙන් රටේ සංවර්ධනයට ද උපකාරි වන බැවින් ව්‍යවසායකත්ව බැංකු ක්‍රමය ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 55/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන අධීක්ෂණයට භාජනය කිරීම,— දිවයිනේ බොහෝ ස්ථානවල ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන වැඩි වැඩියෙන් බිහිවීමේ ප්‍රවණතාවයක් ඇති අතර ව්‍යවසායකයන් බිහිවීම රටට හිතකර වුවත්, එයින් සමාජයට යහපතක් සිදුවිය යුතු බැවින්, බොහෝ ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානවල සිදුවන විෂමාචාර ක්‍රියා වැළැක්වීම සඳහා මෙන්ම, එමඟින් සමාජයීය වශයෙන් ප්‍රතිලාභ සහිත හිතකර තත්ත්වයක් ඇති කිරීම සඳහා මෙම ආයතන ලියාපදිංචි කිරීමට බලය ඇති ආයතන සහ පලාත් පාලන ආයතන මඟින් ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන නිරන්තර අධීක්ෂණයට භාජනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 56/'19

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා, — "ඉන්දියානු දෙමළ" ශීර්ෂය යටතේ සංගණනයට භාජනය වූ ජන කොටස ඉදිරි සංගණන වලදී "කඳුරට දෙමළ" ශීර්ෂය යටතේ සංගණනය කිරීම,— ඉන්දියාවෙන් මෙරටට රැගෙන එන ලද ඉන්දියානුවන් "ඉන්දියානු දෙමළ" ශීර්ෂය යටතේ සංගණනයට භාජනය කෙරෙන අතර වර්තමානයේදී ඔවුන් "කඳුරට දෙමළ" ලෙස තමන්ව හඳුන්වා ගනිමින් ශ්‍රී ලාංකික පුරවැසිභාවය පූර්ණ වශයෙන් භුක්ති විඳින නමුත් "ඉන්දියානු දෙමළ" ලෙස හැඳින්වීමෙන් ඔවුන්ගේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රශ්න කෙරෙන ස්වභාවයක් ඇති බැවින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් ඉදිරියට සිදුකෙරෙන සංගණනවලදී මෙම ජන කොටස "කඳුරට දෙමළ" ශීර්ෂය යටතේ සංගණන කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 57/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ශ්‍රී ලංකාවේ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කිරීම,— ජාතික සංහිඳියාව හා ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ එකමුතුව වඩාත් ඵලදායී ලෙස ගොඩනැගීම සඳහා දීර්ඝ කාලීන ඉලක්කයන්ට මුල පිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාව තුළ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 58/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන ආක්‍රමණශීලී ශාක විශේෂයන්ගේ ව්‍යාප්තිය තුරන් කිරීමට කඩිනම් පියවර ගැනීම,— ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ආක්‍රමණශීලී ශාක විශේෂයන් ගණනාවක් ව්‍යාප්ත වෙමින් පවතින අතර යම් යම් සංවිධාන සහ පුද්ගලයන් විසින් දිවයිනේ මංමාවත් දෙපස, සුසාන භූමිවල සහ ක්‍රීඩා පිට්ටනි ආදී පොදු ස්ථානවල රෝපණය කරන ලද ඇකේෂියා වැනි ශාක හේතුකොටගෙන මී මැසි ප්‍රජාවගේ පැවැත්මට මාරාන්තික තර්ජනයක් වී ඇති බව එම ප්‍රදේශවල සිදුකරන ලද පර්යේෂණවලින් සනාථ වී ඇති බැවින්, ශාක මෙන්ම, සත්ත්ව ප්‍රජාවගේද පැවැත්මට ප්‍රබල තර්ජනයක් වී ඇති මෙවැනි ආක්‍රමණශීලී ශාක විශේෂයන්ගේ ව්‍යාප්තිය වළක්වා මුළුමනින්ම තුරන් කිරීමට කඩිනම් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 59/'19

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා,— වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය නව ක්‍රමයක් හරහා පරිපාලනය කිරීම සඳහා කුඩා වතු හිමිකාරීත්වයන් බවට පත්කොට කම්කරුවන්ට වතු බෙදා දීමට කටයුතු කිරීම,— ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට දීර්ඝ ඉතිහාසයක් පවතින අතර පසුගිය වසර 25ක කාලය තුළ ඔයිල් ෆාම් ප්‍රමුඛ නව බෝග වගාවන් වැවිලි ක්ෂේත්‍රයට ඇතුළත් වී ඇති අතර පුද්ගලීකරණයට ලක්වී ඇති වැවිලි ක්ෂේත්‍රයේ නොමනා කළමනාකරණය හේතුවෙන් මෙම ක්ෂේත්‍රය පරිහානියට පත්වී කම්කරුවන්හට පවා විශ්වාසයෙන් යුතුව තම රැකියාවන්හි නිරත වීම සඳහා වන ආර්ථික සමාජ පරිසරයක් එහි දක්නට නොමැති බැවින්, අප රටේ ප්‍රධාන අපනයන ආදායම් ක්ෂේත්‍රයක් වන වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය දැනට සිදුකර ඇති පෞද්ගලීකරණයෙන් ඉවත් කොට රජයේ මැදිහත්වීම යටතේ නව ක්‍රමයක් හරහා පරිපාලනය කිරීම සඳහා කුඩා වතු හිමිකාරීත්වයන් බවට පත්කොට කම්කරුවන්ට වතු බෙදා දී ඒවා තිරසාරව පවත්වාගෙන යාමට රජය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63 /'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සිනමා ඇකඩමියක් ස්ථාපනය කිරීම,— ශ්‍රී ලාංකීය සිනමා කර්මාන්තය මේ වනවිට 70 වැනි වසර පසු කරමින් සිටින අතර ජාත්‍යන්තර සිනමා උළෙල ජය ගැනීමට තරම් දක්ෂ චිත්‍රපට අධ්‍යක්ෂකවරුන්, නළු නිළියන් ඇතුළු නිර්මාණ ශිල්පීන් බිහි කිරීමට ශ්‍රී ලංකාව සමත්ව තිබුණ ද, එය විෂයයක් ලෙස අනාගත පරපුර වෙත විධිමත්ව ගෙන යාම සඳහා අප රටට තවමත් සිනමා ඇකඩමියක් නොමැති බැවින්, වෘත්තීය සිනමාවක් බිහිකර ගැනීමේ අරමුණ සහිතව සිනමා ඇකඩමියක් කඩිනමින් ස්ථාපනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 64 /'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නූතන කලාගාරයක් ස්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ Modern Art හෙවත් නූතන කලාවේ නිරත ශිල්පීන් අප රටේ සිටිය ද, ඔවුන්ගේ නිර්මාණ ප්‍රදර්ශනය කිරීම සඳහා නූතන කලාගාරයක අඩුවක් පවතින අතර, එවැනි කලාගාරයක් මඟින් අපගේ චිත්‍ර හා මූර්ති ශිල්පය ඇතුළු කලා කටයුතු පෝෂණය මෙන්ම, සංචාරක ව්‍යාපාරයේ වැඩි දියුණුව ද සිදුවන බැවින්, එවැනි නූතන කලාගාරයක් (Modern Art Gallery) කොළඹ ආශ්‍රිතව ස්ථාපනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 65 /'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කිරීම,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය හෙවත් ඊ - අපද්‍රව්‍ය අප රටට බරපතළ අනතුරක් නිර්මාණය කරමින් තිබෙන අතර දැනට වාර්ෂිකව මෙට්‍රික් ටොන් 92,000ක පමණ ඊ - අපද්‍රව්‍ය ජනනය වන අතර, වර්ෂ 2020 වනවිට එය මෙට්‍රික් ටොන් 120,000 දක්වා වැඩිවෙතැයි අපේක්ෂා කෙරෙන අතර ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය, ඒවා බැහැර කිරීම සහ එහි ඇති පාරිසරික හා සෞඛ්‍යමය අනතුර පිළිබඳව ජනතාව දැනුවත් කිරීමටත්, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් හා අඛණ්ඩ ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 66/'19

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— මතභේදයට තුඩු දී ඇති "බැටික්ලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය රජයට පවරාගෙන "මඩකලපුව විශ්වවිද්‍යාලය" ලෙස නම් කිරීම,— රටේ මහත් ආන්දෝලනයකට තුඩු දී ඇති හිරා පදනම මඟින් ආරම්භ කර ඇති "බැටික්ලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය සහ එම ආයතනය මඟින් ඉදිකිරීමට යෝජිත දැනට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීමට අනුමතිය ලබා ගැනීමේ අරමුණින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනය සමාජයේ දැඩි විවේචනයට ලක්වෙමින් පවතින අතර මෙයට ඉඩම් ලබා දී ඇති සහ මුදල් ආධාර ලැබී ඇති ක්‍රමවේදය ඇතුළු යම් යම් ක්‍රමවේදයන් සම්බන්ධයෙන් පැන නැඟී ඇති කරුණු සැලකිල්ලට ගෙන ශරියා විශ්වවිද්‍යාලයක් ලෙස පටබැඳි නාමයකින්ද හඳුන්වන "බැටික්ලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය සහ ඊට සම්බන්ධ සියලු ගොඩනැගිලි රජයට පවරාගෙන රාජ්‍ය විශ්වවිද්‍යාලයක් බවට පත්කර එය "මඩකලපුව විශ්වවිද්‍යාලය" ලෙස නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 67/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ත්‍රස්තවාදීන්ට හා ත්‍රස්තවාදී සංවිධානවලට සම්බන්ධ වූ අයට මරණ දඬුවම ලබාදීම සහ ඔවුන්ගේ සියලු දේපළ රාජසන්තක කිරීම,— ජාත්‍යන්තර හෝ දේශීයව ත්‍රස්තවාදයට සම්බන්ධ ත්‍රස්තවාදීන්ට මෙන්ම, එම ත්‍රස්තවාදී සංවිධානවලට සහ ක්‍රියාකාරීන්ට සෘජුව හෝ වක්‍රව ආධාර, උපකාර, අනුබලදීම් කරන පුද්ගලයන්ගේ එකී ක්‍රියාකාරකම් පිළිබඳව අධිකරණයෙන් ඔප්පු වූ අවස්ථාවකදී, ඔවුන් සතු සියලු දේපළ රාජසන්තක කොට මරණ දඬුවම ලබාදිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 68 /'19

ගරු දයාසිරි ජයසේකර මහතා,— සියලුම මද්රසා පාසල් සහ අරාබි පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පවරා ගැනීම,— දැනට මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දිවයිනේ පිහිටි සියලුම මද්රසා පාසල් සහ අරාබි පාසල් වහාම අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පවරාගෙන මෙම පාසල් තුළ විෂයයක් ලෙස සිංහල ඉතිහාසය ඉගැන්වීමටත්, එම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අධීක්ෂණය කිරීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69 /'19

ගරු දයාසිරි ජයසේකර මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම පාසල් ආගම් සහ ජාතීන් අනුව වර්ග නොවන මිශ්‍ර පාසල් බවට පත්කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම පාසල් ඉදිරි වසරේ සිට ක්‍රමානුකූලව මිශ්‍ර පාසල් බවට පත්කිරීමටත්, සිංහල, දෙමළ, මුස්ලිම්, කතෝලික යනුවෙන් පාසල් ස්ථාපිත කිරීමට අනාගතයේදී ඉඩ නොදීමටත්, ජාතීන් අනුව යම් ප්‍රතිශතයක් යටතේ පාසල් වෙත ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 70 /'19

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජාතීන් හෝ ආගම් අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කිරීම,— වර්තමානයේ උද්ගතව ඇති තත්ත්වය සැළකිල්ලට ගෙන ශ්‍රී ලංකාව තුළ ජාතීන් හෝ ආගම් අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කොට දැනට එසේ ජාතීන් හෝ ආගම් නමින් ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂවල නාමයන්ද වෙනස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71 /'19

ගරු තිලංග සුමතිපාල මහතා,— "බැටික්ලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය රජයට පවරාගෙන රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම,— පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් පැන නැගී ඇති බැරෑරුම් තත්ත්වය හමුවේ විශේෂයෙන්ම බහුතර ප්‍රජාවගේ ආරක්ෂාව පිළිබඳ විශ්වාසය තහවුරු කිරීමටත්, ශ්‍රී ලංකාවට ඉදිරියේදී එවැනි අවස්ථාවන් ඇති නොවීමටත්, විශේෂයෙන්ම අන්තවාදී මත දරන්නන්ගෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශ මෙන්ම, සමස්ත ශ්‍රී ලංකාවම ආරක්ෂා කර ගැනීමටත්, "බැටික්ලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට පවරාගෙන රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයක් බවට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.72/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— පඬුවස්නුවර රාජධානිය සංචාරක සැලැස්මට ඇතුළත් කොට සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ පැරණි රාජධානියක් ලෙස සැලකෙන පඬුවස්නුවර රාජධානිය සංචාරක සැලැස්මට ඇතුළත් කොට සංවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.73/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— පුරවැසියන්ගේ සෞඛ්‍ය අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ගත කිරීම,— ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම තමන්ට වැළඳෙන රෝගාබාධයක් හෝ මුහුණපෑමට සිදුවන අනතුරක් හෝ සම්බන්ධයෙන් රජයේ වියදමින් නොමිලේ ප්‍රතිකාර ලබා ගැනීමට ඇති අයිතිය ද, බෝවන හෝ බෝනොවන රෝගාබාධ වළක්වා ගැනීමට අවශ්‍ය නිවාරණ හා උපදේශන මෙන්ම, පුනරුත්ථාපන සේවාවන් ගුණාත්මකව හා සාධාරණව ලබා ගැනීමට ඇති අයිතිය ද පිළිගනිමින් එය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ගත විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'19

ගරු රොෂාන් රණසිංහ මහතා,— ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ විවාහ සම්බන්ධයෙන් පොදු නීති මාලාවක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ජීවත්වන විවිධ ජාතීන් බෙදා වෙන් කරන ආකාරයේ නීති රට තුළ ක්‍රියාත්මක වන හෙයින්, ඒවා නිවැරදි කිරීම පිණිස විශේෂයෙන් විවාහවීමේ නීතිය සෑම පුරවැසියෙකුටම පොදු නීතියක් විය යුතු බවත්, උඩරට විවාහ නීතිය, මුස්ලිම් විවාහ නීතිය වශයෙන් වෙනස් නොවිය යුතු බවත්, එක් පුරවැසියෙකුට සිදුකර ගත හැක්කේ එක් විවාහයක් පමණක් බවත්, එය වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් අනතුරුව බවත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ විවාහ සම්බන්ධයෙන් පොදු නීති මාලාවක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## **2019 ඔක්තෝබර් 08** වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

31/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1978 වර්ෂයෙන් ඇරඹි පළමුවන පාර්ලිමේන්තුවේ සිට අටවැනි පාර්ලිමේන්තුව දක්වා එක් එක් පාර්ලිමේන්තුවට අදාළව ඇති කරන ලද අමාත්‍ය මණ්ඩලවල සිටි කැබිනට්, රාජ්‍ය සහ නියෝජ්‍ය අමාත්‍යවරයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් අමාත්‍ය මණ්ඩලයේ සිටි අමාත්‍යවරියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් අමාත්‍ය මණ්ඩලයේ සිටි අමාත්‍යවරියන් සංඛ්‍යාව අදාළ අමාත්‍ය මණ්ඩලයේ සිටි මුළු අමාත්‍යධුර සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) රටේ වර්තමාන කාන්තා ජනගහනයේ ප්‍රතිශතයට සරිලන සාධාරණ නියෝජනයක් අමාත්‍ය මණ්ඩල තුළ කාන්තාවන්ට ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

91/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෙරටට ටින් මාලු ආනයනය කරනු ලබන රටවල් කවරේද;

(ii) එම ටින් මාලු ආනයනය කරනු ලබන මෙරට සමාගම් කවරේද;

(iii) 2018 වර්ෂය තුළ පරිභෝජනයට නුසුදුසු ටින් මාලු ආනයනය කළ අවස්ථා කවරේද;

(iv) එම ටින්මාලු ආනයනය කළ සමාගම් සහ ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) අදාළ ආනයන කටයුතු සඳහා පාරිභෝගික සේවා අධිකාරියේ අවසරය ලබා දී තිබේද;

(vi) ආනයනය කළ භාවිතයට නුසුදුසු ටින් මාලු සඳහා ගනු ලබන පියවර කවරේද;

(vii) ඊට පෙර අවස්ථාවලදීද පරිභෝජනයට නුසුදුසු ටින් මාලු ආනයනය කර තිබේ නම්, එම අවස්ථාවලදී ආනයනය කළ සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

147/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව පළාත තුළ පිහිටි දේශීය කිරිපිටි කම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්ත ශාලාවල නම් හා ලිපිනයන් කවරේද;

(iii) යහපාලන රජය බලයට පත්වීමෙන් පසු මේ දක්වා එම කර්මාන්ත ශාලාවල නිෂ්පාදන ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) වර්තමානයේදී ඌව පළාත් දේශීය කිරිපිටි කම්හල් මුහුණ දී ඇති ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

209/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2017 වර්ෂයේදී,

(i) දුම්රිය භාවිතා කළ මගීන් සංඛ්‍යාව;

(ii) මගී ප්‍රවාහනයෙන් ලැබුණු ආදායම;

(iii) මුද්‍රණය කරන ලද දුම්රිය ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව;

(iv) දුම්රිය ප්‍රවේශ පත්‍ර මුද්‍රණය සඳහා වැය කළ මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මගී ප්‍රවාහනය සඳහා දිනකට යෙදවිය යුතු දුම්රිය ගමන් වාර සංඛ්‍යාව;

(ii) සාමාන්‍යයෙන් දිනකට ක්‍රියාත්මක වන ගමන් වාර සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

269/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

343/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැකිරාව නගරයේ පිහිටි හින්දු කෝවිල ඉතාමත් පැරණි හා අබලන් තත්ත්වයේ පවතින බව දන්නේද;

(ii) දැනට මන්දගාමීව සිදුවන ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් සිදුකර මෙම කෝවිල ආගමික කටයුතු සඳහා හින්දු බැතිමතුන්ට පවරා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

433/'19

ගරු කනක හේරත් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සිවිල් ගුවන්සේවා අධිකාරියේ සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ස්ථිර සේවක සංඛ්‍යාව සහ කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) සිවිල් ගුවන්සේවා අධිකාරියේ, අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහ අංශ ප්‍රධාන අධ්‍යක්ෂවරුන්ගේ වයස් සීමාවන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම අධිකාරියේ සිටින උපදේශකවරුන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ වයස් සීමාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සිවිල් ගුවන්සේවා අධිකාරියේ නිලධාරින් විශ්‍රාම යනවිට පුරප්පාඩු වන එම තනතුරු සඳහා සුදුසුකම්ලත් දෙවන පෙළ නිලධාරින් කණ්ඩායමක් යෙදවීමට සැලසුම් කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

455/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මධ්‍යම අධිවේගී මාර්ගයේ, කුරුණෑගල සිට ගලගෙදර දක්වා ඉදිවෙන කොටසේ,

(i) සමස්ත දුර ප්‍රමාණය;

(ii) ඇස්තමේන්තුගත මුළු වියදම;

(iii) පිවිසුම් හා පිටවීමේ දොරටු ස්ථාපනය වන ස්ථාන;

(iv) ඉදිකිරීම් ආරම්භ කිරීමට හා අවසන් කිරීමට නියමිත දිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අධිවේගී මාර්ගයේ ඉහත කොටස සඳහා මේ දක්වා,

(i) පවරා ගත් ඉඩම් ප්‍රමාණය;

(ii) ගෙවා ඇති මුළු වන්දි මුදල;

(iii) ගෙවීමට ඇති වන්දි මුදල් ප්‍රමාණය;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

467/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කය තුළ පිහිටි පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) මෙම එක් එක් පළාත් පාලන ආයතන මඟින් පාලනය වන ළමා උද්‍යාන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

(v) 2010 වර්ෂයේ සිට මේ දක්වා මෙම එක් එක් ළමා උද්‍යානය සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ලබා දී ඇති වාර්ෂික ප්‍රතිපාදනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) මෙම ළමා උද්‍යාන තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය දැනට ගෙන ඇති පියවර සහ ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

504/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් මධ්‍යම නුවර ගම් පළාතේ ඉදිකළ නිවාස යෝජනා ක්‍රමයේ නිවාස බෙදා දෙනු ලැබූ පදනම කවරේද;

(ii) බෙදා දෙනු ලැබූ නිවාස ලබාගත් එක් එක් පුද්ගලයාගේ නම, නිවසේ අංකය, නිවාසලාභියා රජයේ සේවකයෙක්ද, රජයේ විශ්‍රාමිකයෙක්ද යන්න සඳහන් කරන්නේද;

(iii) නිවාස යෝජනා ක්‍රමය ප්‍රදේශයේ වන අලින් ගමන් ගන්නා අලිමංකඩක් අවහිර වන පරිදි ඉදිකර ඇති බව දන්නේද;

(iv) නිවාසලාභීන්ගේ ජීවිත ආරක්ෂාව සඳහා අලි වැටක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස යෝජනා ක්‍රමය විවෘත කිරීම සම්බන්ධයෙන් ප්‍රචාරක කටයුතු සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) නිවාස යෝජනා ක්‍රමය විවෘත කිරීම සඳහා ඉදි කරන ලද ඵලකය සඳහා ගෙවා ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ, නම් ඒ මන්ද?

518/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2014.01.01 දින සිට 2015.01.01 දින දක්වා ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් රාජ්‍ය බැංකුවලින් ලබාගෙන ඇති මුළු උකස් ණය ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතරින් ස්වර්ණාභරණ උකස්කර ලබාගෙන ඇති ණය ප්‍රමාණය කොපමණද;

(iii) ස්වර්ණාභරණ උකස්කර රුපියල් ලක්ෂ දෙකට වඩා අඩුවෙන් ණය ලබාගෙන ඇති ස්ත්‍රීන් හා පුරුෂයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (i) හි සඳහන් ණය ප්‍රමාණය එම කාලසීමාව තුළ නිකුත් කර ඇති සමස්ත ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

619/'18

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොල - දොළොස්බාගේ මාර්ගය මංතීරු දෙකකට පුළුල් කිරීම සඳහා 2012 වර්ෂයේදී වැඩකටයුතු ආරම්භකර මේ වනවිට කුරුඳුවත්තේ සිට වැලිකන්ද දක්වා කිලෝමීටර් 7ක දුරක් කාපට් අතුරා වැඩ අවසන් කර ඇති බවත්;

(ii) 2015 ජනවාරි සිට පුරා වසර තුන හමාරක කාලය තුළ මෙම මාර්ගයේ කිසිදු වැඩ කටයුත්තක් සිදු නොවූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) විශාල වාහන ප්‍රමාණයක් හා විශාල ජනතාවක් භාවිතා කරන මෙම මාර්ගයේ ඉතිරි කිලෝමීටර් 4 සඳහා ප්‍රතිපාදන වෙන්කර වැඩ ආරම්භ කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

655/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ත්‍රිකුණාමලය – නුවර පාරේ, 6 කණුවේ සිට ත්‍රිකුණාමලය – අනුරාධපුර පාරේ, කින්නියා දක්වා දිවෙන ත්‍රිකුණාමලය පිටත වටරවුම් පාරේ වැඩ ආරම්භ කර වර්ෂ ගණනාවක් ගත වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2013.07.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මංතීරු 6ක් දක්වා වැඩි කළ හැකි වන පරිදි මං තීරු 4කින් යුක්තව මෙම මාර්ගය ඉදිකරන්නේද;

(ii) 2015 ජනවාරි වනවිටත් පාර කපා බොරළු දමා සකස් කර තිබුනද, අද වන තෙක්ම ගල් අතුරා කාපට් දැමීමට නොහැකි වීමට හේතුව කවරේද;

(iii) මේ වනවිට ඉදිකිරීම් භාර කොන්ත්‍රාත් සමාගම කවරේද;

(iv) මෙම මාර්ගයේ ඉදිකිරීම් අවසන් කර භාරදිය යුතු දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

676/'19

ගරු චන්දිම ගමගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිපාදන යටතේ රුපියල් ලක්ෂ 368ක ඇස්තමේන්තුවකට NELSIP ව්‍යාපෘතිය මඟින් කැකිරාව ක්‍රීඩා පිටිය සංවර්ධනය කළ බවත්;

(ii) ව්‍යාපෘතියේදී සිදු වූ අක්‍රමිකතා හේතුවෙන් ව්‍යාපෘතිය අත්හැර දැමීමට සිදු වූ බවත්;

(iii) කැකිරාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් අනුරාධපුර පළාත් පාලන කොමසාරිස් මඟින් සහ NELSIP ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා මඟින් තත්ත්ව පාලනය, ප්‍රමිතිය හා වැය කරන ලද මුදල් සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නියෝග කර ඇතත්, එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොමැති බවත්;

(iv) මෙම ව්‍යාපෘතියේ රුපියල් ලක්ෂ 35ක පමණ වංචා දූෂණ සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පළාත් පාලන කොමසාරිස්, ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති සහ ප්‍රාදේශීය සභා ලේකම්ගේ අවශ්‍යතාවය මත මෙම ක්‍රීඩා පිටිය මහජන අයිතියට පැවරීමට සහ පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට පෙර සංගීත සංදර්ශනයක් සඳහා පරිහරණය කරන ලද බවත්;

(ii) මෙම ක්‍රියාකලාපය මඟින් සිදු වූ වංචා දූෂණ වසන් කිරීමට උත්සාහ දරන බවත්;

තවදුරටත් එතුමා දන්නෙහිද?

(ඇ) පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීමට සහ ක්‍රීඩා පිටිය මහජන අයිතියට පවරන තෙක් පරිහරණය කිරීම ප්‍රමාද කරන ලෙස නියෝග කරන්නෙහිද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

688/'18

ගරු බිමල් රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2010 සිට 2017 දක්වා කොළඹ, ගාල්ල, මාතර, නුවර, කුරුණෑගල, යාපනය සහ ගම්පහ දිස්ත්‍රික්කවල ජාතික පාසල්වල,

(i) 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු කවරේද;

(ii) ශිෂ්‍යත්ව ප්‍රතිඵල මත 6 වැනි ශ්‍රේණියට ඇතුලත් වූ ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) 5 ශ්‍රේණියේ සහ 6 ශ්‍රේණියේ සමාන්තර පන්ති සංඛ්‍යාව කොපමණද;

(iv) 6 වැනි ශ්‍රේණියට ශිෂ්‍යත්ව ප්‍රතිඵල පදනම් කර නොගෙන ප්‍රාථමික අංශයේ සිට පැමිණි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(v) 6 ශ්‍රේණියේ මුළු සිසුන් සංඛ්‍යාවෙන්, ශිෂ්‍යත්ව ප්‍රතිඵල මත ඇතුලත් වූ සිසුන්ගේ ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 ඔක්තෝබර් 09 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

22/’18

ගරු හේෂා විතානගේ මහතා,— බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ලියාපදිංචි කර ඇති දහම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) දහම් පාසල් ගුරුවරුන්ට රජය විසින් ලබාදෙන ප්‍රතිලාභ කවරේද;

(iii) දහම් අධ්‍යාපනය නංවාලීම සඳහා මෙම ස්වේච්ඡා දහම් පාසල් ගුරුවරුන් වෙනුවෙන් ඉදිරියට සැලසුම් කර ඇති වැඩසටහන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

92/’18

ගරු දයාසිරි ජයසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා විනාශ කර ඇති පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් සඳහන් කරන්නේද;

(iii) එම පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීමට හේතු කවරේද;

(iv) අදාළ පුරාවිද්‍යා ස්ථාන විනාශ කළ පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(v) ඔවුන්ට ලබාදුන් දඬුවම් කවරේද;

(vi) හඳුනානොගත් පුද්ගලයන් විසින් විනාශ කර ඇති පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(vii) රටක ඓතිහාසික අභිමානය සුරකින පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීමට එරෙහිව ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

346/’18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහවැලි H කලාපයේ පිහිටි ගල්නෑව බස්නැවතුම්පොළ ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බව දන්නේද;

(ii) එය මගී ජනතාවට භාවිතයට ගත හැකි වන අයුරින් අලුත්වැඩියා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

434/'19

ගරු කනක හේරත් මහතා,— සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා දෙස් විදෙස් සංචාරකයන් විශාල සංඛ්‍යාවක් පැමිණෙන බවත්, එම ආයතනය මඟින් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබාදෙන බවත් දන්නේද;

(ii) වර්ෂ 2015 සිට 2018 දක්වා පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා පැමිණි විදේශීය සංචාරකයන් සංඛ්‍යාව, එක් එක් කාර්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2015 සිට 2018 දක්වා එමඟින් ලැබුණු ආදායම එක් එක් වර්ෂය සහ කාර්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පින්නවල අලි අනාථාගාරය නැරඹීමට පැමිණෙන සංචාරකයන්ට අලි පැටවුන්ට කිරි පෙවීම සඳහා අවස්ථාවක් ලබා දීම මේ වනවිට නවතා තිබේ නම්, එයට හේතු කවරේද;

(ii) ඒ හේතුවෙන් ආයතනය වාර්ෂිකව ලබන අලාභය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට වටිනා සම්පතක් වන පින්නවල අලි අනාථාගාරය වැඩිදියුණු කිරීම සඳහා රජය මඟින් යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

608/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත්,

(i) කාර්මික ජනපද සංඛ්‍යාව;

(ii) බිම් ඒකක සංඛ්‍යාව;

(iii) කාර්මික ජනපදවල ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව;

(iv) කාර්මික ජනපදවල සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2017 වර්ෂයේදී කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මධ්‍යම පළාත වෙනුවෙන්,

(i) ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදුකළ වැඩසටහන්;

(ii) එම වැඩසටහන් පැවැත් වූ ස්ථාන;

(iii) ලබා දී ඇති උපකරණ;

(iv) ප්‍රතිලාභීන් තෝරාගත් පදනම;

(v) සිදුකරනු ලැබූ තාක්ෂණික පුහුණු වැඩසටහන්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ විද්‍යුත් ව්‍යාපාර සිදුකිරීමේ හැකියාව ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා ද විවෘතව පවතින නමුත්, ඒ සඳහා අවශ්‍ය දැනුම ප්‍රමාණවත් පරිදි ලබා දී නොමැති බව පිළිගන්නේද;

(ii) මෙම දැනුම විධිමත්ව ලබාදීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

620/'18

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නාවලපිටිය නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නාවලපිටිය නගරයේ වාහන තදබදය අවම කිරීමේ අරමුණින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රුපියල් ලක්ෂ 300ක වියදමින් නාවලපිටිය නගරය මැදින් ගුවන් පාලමක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) වත්මන් නාවලපිටිය නගර සභාව විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ අවසරයකින් තොරව මෙම රාජ්‍ය දේපළ කඩා ඉවත්කර විකිණීමට යන බව දන්නේද;

(iii) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිකළ මෙම පාලම ඔබ අමාත්‍යාංශයේ අවසරයකින් තොරව කඩා ඉවත් කිරීම නතර කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

656/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කන්තලේ නගරයේ වාරිමාර්ග යාන්ත්‍රික වැඩපොළ අසළ සිට සම්පත් බැංකුව පිහිටා ඇති ස්ථානය දක්වා වූ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් භූමියේ කඩ කාමර 40ක් පමණ පිහිටා ඇති නමුත්, භූමියේ නිරවුල් අයිතිය ව්‍යාපාරිකයන්ට නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ස්ථිර ඉදිකිරීම් සහිතව ව්‍යාපාරික ස්ථාන වශයෙන් දැනට භුක්ති විඳින එම ඉඩම් කොටස් වාරිමාර්ග දෙපාර්තමේන්තු අයිතියෙන් මුදා හැරීමට කටයුතු කරන්නේද;

(ii) එකී ව්‍යාපාරිකයන් අද පවතින තත්ත්වයට එම ඉඩම් කොටස් වැඩිදියුණු කර ඇත්තේ යුද ගැටුම් සහිත දුෂ්කර කාලවකවානුවක් තුළ බැවින්, එම ඉඩම්වල වාණිජ වටිනාකම් ඔවුන්ගෙන් අය කිරීමකින් තොරව, භුක්තිය පිළිබඳව සළකා බැලිය නොහැක්කේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

773/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට 2016 වර්ෂයේ ජනවාරි සිට 2018 අගෝස්තු 31 දින දක්වා ලබා දී ඇති ණය මුදල් වටිනාකම කොපමණද;

(ii) මෙම ණය සඳහා අයකරනු ලබන පොලී අනුපාතිකය කොපමණද;

(iii) ඉහත ණය මුදල ගෙවා අවසන් කිරීම සඳහා ලබා දෙන උපරිම කාලසීමාව කොපමණද;

(iv) එම ණය මුදල් ලබාදීමේ දී අදාළ මූල්‍ය ආයතන තබා ගනු ලබන ඇපකර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) ට අනුව ලබා දී ඇති ණය මුදලින්, 2018 අගෝස්තු 31 දින වනවිට අය වී ඇති මුළු මුදල හා පොළිය කොපමණද;

(ii) මේ වනවිට අයවිය යුතු නමුත්, මෙතෙක් අය වී නොමැති ණය මුදල් අයකර ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සෑහීමට පත්වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 ඔක්තෝබර් 10 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

28/'18

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ සෑම ග්‍රාම නිලධාරි වසමක් සඳහාම "සේවා පියස" කාර්යාලයක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) "සේවා පියස" එක් කාර්යාලයක් ඉදිකිරීමට ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මෙම වැඩසටහන අවසන් කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

151/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ හා සම්බන්ධ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලට සහභාගී වූ, පළාත් පාලන නියෝජිතයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නියෝජිතයන්ගේ නම් හා අදාළ පළාත් පාලන ආයතන කවරේද;

(iii) එම වැඩමුළු පැවති රටවල්, නගර හා කාලසීමා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම එක් එක් වැඩමුළුවලට සහභාගී වීම සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම වැඩමුළුවලින් පසුව කසළ කළමනාකරණය සඳහා වැඩසටහන් දියත් කළ පළාත් පාලන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

422/'19

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා Hyrax oil Sdn Bhd යන සමාගම අතර ලිහිසි තෙල් කලවම් කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම ගිවිසුමට අනුව එකඟතාවයට පැමිණි මූලික කරුණු පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iv) ඉහත ගිවිසුමට අනුව අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් නිසි අවසරයක් ගෙන තිබේද;

(v) ඉහත ගිවිසුම අනුව අදාළ සමාගම දැනටමත් ශ්‍රී ලංකාව තුළ ලිහිසි තෙල් කලවම් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදි කර තිබේද;

(vi) යෝජිත ලිහිසි තෙල් කලවම් කිරීමේ මධ්‍යස්ථානයට අවශ්‍ය තෙල් වර්ග ආනයනය කිරීමට බලපත්‍ර ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

557/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1940 දශකයේ සිට කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පැවති ප්‍රධාන ඉන්ධන ගබඩාව යුද්ධය හේතුවෙන් විනාශ වූ අතර එය එම ස්ථානයෙන් ඉවත් කළ බව දන්නේද;

(ii) එම ඉන්ධන ගබඩාව පිහිටා තිබූ ඉඩම මේ වනවිට භාරව ඇත්තේ කවරෙකුටද;

(iii) එය එම පාර්ශ්වයට දීර්ඝ කාලීනව බදු දී තිබේද;

(iv) ප්‍රධාන ඉන්ධන ගබඩාව නැවතත් එම ඉඩමේ පිහිටුවීමට කටයුතු කරන්නේද;

(v) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වෙනත් ඉඩම් තිබේද;

(vi) එසේ නම්, ඒවා පිහිටා ඇති ස්ථාන සහ විශාලත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(ii) හි සඳහන් ඉඩමෙහි මේ වනවිට පවත්වාගෙන යන ඉන්ධන පිරවුම්හල පුද්ගලික පාර්ශ්වයකට අයත් බව දන්නේද;

(ii) එසේ නම්, එහි අයිතිකරු කවුරුන්ද;

(iii) එම ඉඩම බදු දී ඇති කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පච්චිලෙප්පල්ලි විවිධ සේවා සමූපකාර සමිතිය විසින් පච්චිලෙප්පල්ලි ප්‍රදේශයේ ඉන්ධන පිරවුම්හලක් පිහිටුවීම සඳහා කරන ලද ඉල්ලීමට මෙතෙක් අනුමතිය ලබානොදීමට හේතු කවරේද;

(ii) මේ වනවිට එම ප්‍රදේශයේ පුද්ගලික ඉන්ධන පිරවුම්හල් දෙකක් පිහිටුවීමට අනුමතිය ලබාදුන් පදනම කවරේද;

(iii) එම පිරවුම්හල් පච්චිලෙප්පල්ලි ප්‍රදේශයේ පිහිටා ඇති ස්ථාන සහ හිමිකරුවන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

609/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුස්සැල්ලාව නගරයේ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආගමික ස්ථානවල නම් කවරේද;

(iii) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, මේ දක්වා එම ආගමික ස්ථාන සංවර්ධනය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

643/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දියානු සාගරයේ සමුද්‍රීය කටයුතු පිළිබඳ කලාපීය සංවිධානය Indian Ocean Marine Affairs Cooperation (IOMC) නමැති ආයතනයක් ශ්‍රී ලංකාවෙහි තිබේද;

(ii) එසේ නම්, එහි අරමුණු හා කාර්යභාරය කවරේද;

(iii) එය කලාපීය සංවිධානයක් නම්, එහි සාමාජික රටවල් කවරේද;

(iv) එහි සම්මුතිය කවරේද;

(v) එම සම්මුතියේ පිටපතක් ලබා දෙන්නේද;

(vi) එම සම්මුතිය අපරානුමත කර ඇත්නම්, එම රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

686/'18

ගරු කනක හේරත් මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග වගා කර ඇති ඉඩම් ප්‍රමාණය සහ එම වගාවන්හි යෙදෙන ගොවීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2015 සිට 2018 දක්වා ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග ඵලදාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සුළු අපනයන භෝග වගාකරුවන් සඳහා රජය මඟින් ලබාදෙන සහනාධාර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග වගාව පහත වැටී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

779/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018.04.30 දින දක්වා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කළමණාකරු (මානව සම්පත්/පාලන) ලෙස කටයුතු කළ නිලධාරියාගේ නම, තනතුරට පත් කරනු ලැබූ දිනය, තනතුරට අදාළ මාසික වැටුප සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) ඔහු ඉහත තනතුරට පත් කිරීමට පෙර එම අධිකාරිය තුළ වෙනත් තනතුරු දරා තිබේද;

(iii) එසේ නම්, තනතුරු සංඛ්‍යාව, තනතුරු නාම සහ තනතුරුවලට අදාළව ලබාගත් මාසික වැටුප කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම නිලධාරියා අධිකාරියේ තනතුරට අමතරව වෙනත් රාජ්‍ය ආයතනයක, දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක කිසියම් තනතුරක් දරා තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ නම සහ ලැබූ මාසික දීමනාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

868/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී කුවේට් අරමුදල නමැති ප්‍රභවයකින් නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට අරමුදල් වෙන් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, 2015 වර්ෂයේදී එම මුදල වැය නොකිරීමට හේතු කවරේද;

(iii) මේ වනවිට එම මුදල එම කටයුත්ත සඳහා වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

884/'19

ගරු බිමල් රත්නායක මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 නියං සහනාධාර අදියර II යටතේ සහන ලබා දී ඇති දිස්ත්‍රික්ක කවරේද;

(ii) ඒ සඳහා තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ඒ සඳහා වැය කළ මුළු මුදල එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ සඳහා නිකුත් කළ චක්‍රලේඛ කවරේද;

(iv) ඒ අතරින් අවසන්වරට ක්‍රියාත්මක වූ වලංගු චක්‍රලේඛය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වලංගු චක්‍රලේඛයට අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ ඒ සඳහා වැය කළ මුළු මුදල එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව කවරේද;

(ii) අවලංගු වන අවස්ථාව වනවිට අංක NDRC/2018/03 චක්‍රලේඛයට අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ හඳුනාගෙන තිබූ ප්‍රතිලාභීන් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පීඩාවට පත් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) පොල්පිතිගම එයට ඇතුලත් නොවන්නේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

972/'19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පොලිස්පතිවරයාගේ ප්‍රධානත්වයෙන් පසුගිය වර්ෂයේ ආරම්භ කළ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රණවිරු ගම්මානය තුළ ස්ථාපිත කර ඇති ඉපලෝගම පොලිස් ස්ථානය තාවකාලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බව දන්නේද;

(ii) පොලිස් ස්ථානයකට සුදුසු ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර එහි පොලිස් ස්ථානය පවත්වාගෙන යෑමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1025/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 281, 282, 283 සහ 284 හි සඳහන් කර ඇති කරුණු අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය වෙනුවෙන් අනුගමනය කළ ප්‍රධාන ක්‍රියාමාර්ග පැහැදිලි කරන්නේද;

(ii) යෝජනා අංක 284ට අනුව, ශ්‍රී ලංකාවේ සුරැකුම් හා විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) කොටස් වෙළෙඳපොළ වර්ධනය මැන බැලීම සඳහා යොදා ගන්නා සම්මත දර්ශකයන්ට අනුව, වර්ෂ 2000 සිට 2017 දක්වා, ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොළෙහි ප්‍රගතිය පිළිබඳ උපනතීන් දැක්වෙන වගුවක් ඉදිරිපත් කරන්නේද;

(iv) වර්තමානයේදී අසාමාන්‍ය ලෙස පොළී අනුපාතිකය ඉහළ ගොස් පැවතීම, කොටස් වෙළෙඳපොළ සංවර්ධනයට බාධාවක් ලෙස සලකන්නේද;

(v) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් දරනු ලබන අදහස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1037/'19

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වී ඇති, නමුත්, මේ වනතෙක් තීන්දුවක් ලැබී නොමැති මානව හිමිකම් සම්බන්ධ නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එකී නඩු ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වූ දින කවරේද;

(iii) එකී සියලු නඩුවලට අදාළ පැමිණිලිකරුවන් සහ නඩු අංක කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1045/'19

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික සමඟිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පිහිට වූ දිනය කවරේද;

(ii) එම කාර්යාලය පිහිටුවන ලද පනත කවරේද;

(iii) එහි අරමුණ කවරේද;

(iv) එහි නිලධාරි මණ්ඩලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කාර්යාලයට අයත් විෂය පථය කවරේද;

(ii) ආදායම් ලැබීම දේශීය හා විදේශීය වශයෙන් කවරේද;

(iii) අරමුදල් ලබා දුන් පුද්ගලයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වියදම් සාරාංශය කවරේද;

(v) මේ වනතෙක් සිදු කළ වැඩසටහන් සහ ඒවා මෙහෙයවීම් සිදු කළ පුද්ගලයන් කවුරුන්ද;

(vi) මේ සඳහා අරමුදල් සැපයූ රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(vii) සංහිඳියාව වර්ධනයට සිදු කළ කාර්යභාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1047/'19

ගරු අනුරාධ ජයරත්න මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018.03.18 දින ගම්පොළ මූලික රෝහලෙහි නව හදිසි අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකය සඳහා මුල්ගල තැබූ බවත්;

(ii) රෝහල් පරිශ්‍රයේ ඉඩකඩ සීමිත බැවින්, රෝහල් පාලන අධිකාරියේ ඉල්ලීම පරිදි යෝජිත ගොඩනැගිල්ලෙහි පදනම මහල් පහකට යෝග්‍ය වන පරිදි සැකසීමට තීරණය වූ බවත්;

(iii) පාලන අධිකාරියේ ඉල්ලීම නොසලකා හරිමින් අමාත්‍යාංශය මඟින් ගොඩනැගිල්ලේ පදනම මහල් දෙකකට යෝග්‍ය පරිදි සැකසීමට තීරණය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අදාළ ඉදිකිරීම් කටයුතු නියමිත පරිදි කරගෙන යෑම සඳහා ගිවිසුම්ගතව තිබුණද, මෙකී කාර්යය මන්දගාමීව සිදුවීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 ඔක්තෝබර් 11 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

33/'18

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිරිවෙන් අධ්‍යාපන ආයතන සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේදී සලකා බලනු ලබන මූලික අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) දැනට පිරිවෙන් අධ්‍යාපන ආයතනවල ගුරු හිඟයක් පවතින්නේද;

(iii) එසේ නම්, ගුරුවරුන්ගේ හිඟය කොපමණද;

(iv) අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකය මඟින් පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

153/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැළිකසළ සම්බන්ධව තීරණ ගන්නා, ඒ සම්බන්ධව කටයුතු කරන පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ආයතන කවරේද;

(ii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනවල නිලධාරීන් කැළිකසළ කළමනාකරණය සම්බන්ධව විදේශ අධ්‍යයන චාරිකාවල නිරත වී තිබේද;

(iii) එසේ නම්, එම නිලධාරීන්ගේ නම්, තනතුරු හා විදේශ අධ්‍යයනවල විස්තර කවරේද;

(iv) එම එක් එක් අධ්‍යයන කටයුතු සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එකී අධ්‍යයන චාරිකාවලට සහභාගි වූ නිලධාරීන්ගේ දැනුම අමාත්‍යාංශයේ කටයුතුවලට යොදාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

366/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ග්‍රේඩ්වැලි වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

558/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ නගර මාධ්‍යයේ පිහිටා ඇති සතොස වෙළඳ මධ්‍යස්ථානය ප්‍රාදේශීය සභාවේ අනුමතියකින් තොරව ඉදිකර ඇති බව දන්නේද;

(ii) සතොස ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම අයිති ආයතනය කවරේද;

(iii) මෙම ඉඩම කිසියම් පුද්ගලයෙකුට දිගුකාලීනව බදු දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සතොස වෙළඳ මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන මෙම ගොඩනැගිල්ල,

(i) ඉදිකිරීම සඳහා කරෙච්චි ප්‍රාදේශීය සභාවේ අනුමතිය ලබාගෙන තිබේද;

(ii) එම ගොඩනැගිල්ලේ වර්තමාන අයිතිකරුගේ නම කවරේද;

(iii) රජයේ වියදමින් ඉදිකර තිබේ නම්, මිල ගණන් කැඳවීම පිළිබඳ තොරතුරු කවරේද;

(iv) ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දරන ලද පිරිවැය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

610/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ දෙක තුළ මහනුවර දිස්ත්‍රික්කයේ,

(i) සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාව;

(ii) මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූ පුද්ගලයන් සංඛ්‍යාව;

(iii) අත්අඩංගුවට පත් වූ මත්ද්‍රව්‍යවල වටිනාකම;

වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දැනට හඳුනාගෙන ඇති තහනම් මත්ද්‍රව්‍ය ගණයට අයත් මත්ද්‍රව්‍ය වර්ග හා ඒවා මෙරටට පැමිණෙන රටවල් ඇතුළත් නාමලේඛනයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොළ හා අවට ප්‍රදේශ කලක සිට මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ මධ්‍යස්ථානයක්ව පවතින බවත්, පාසල් ශිෂ්‍යයන් හා තරුණ පිරිස් ඉලක්ක කරගනිමින් සිදුකරන මෙම බෙදාහැරීමේ ජාලය තවමත් ශක්තිමත්ව ක්‍රියාත්මක වන බවත් දන්නේද;

(ii) මෙම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් කඩිනමින් නීතියේ රැහැනට හසුකර, මත් උවදුර ප්‍රදේශයෙන් තුරන් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

666/'18

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැතිවීම හේතුවෙන් ජනතාව බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

(ii) විශේෂයෙන්, මුලතිව් දිස්ත්‍රික්කයේ ඉතාමත් දුෂ්කර ප්‍රදේශ වන කෝට්ටෛකට්ටියකුලම්, තෙන්නියන්කුලම්, නාට්ටාංකණ්ඩල්, මුත්තුඅය්යන්කට්ටු යන ප්‍රදේශවල නිසි ප්‍රවාහන පහසුකම් නොමැතිවීම හේතුවෙන් පාසල් සිසුන් ඇතුලු පොදු ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

(iii) ධාවන කටයුතු සඳහා මුලතිව් ලංගම ඩිපෝවට බස්රථ 32 අවශ්‍යතාවයක් ඇතත්, දැනට තිබෙන බස්රථ 24 ක සංඛ්‍යාවෙන් ධාවනය සඳහා යොදවා ඇත්තේ බස්රථ 20 පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මුලතිව් ලංගම ඩිපෝවට තවත් නව බස්රථ ලබාදී, පොදු ජනතාවගේ පහසුව උදෙසා මගී බස් රථ සේවය ක්‍රමවත්ව ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

806/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.02.01 දින සිට මේ දක්වා අත්අඩංගුවට ගනු ලැබූ නීති විරෝධී මත්ද්‍රව්‍ය අලෙවිය හා භාවිතය සම්බන්ධ පුද්ගලයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) නීති විරෝධී මත්ද්‍රව්‍ය මර්දනය කිරීම සඳහා ක්‍රියා කරනු ලබන රාජ්‍ය හෝ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවල නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනය මඟින් අත්අඩංගුවට ගනු ලැබූ නීති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

815/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආසියානු සංවර්ධන බැංකු ආධාර මත ක්‍රියාත්මක i - ROAD ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනා වී තිබූ ව්‍යාපෘති කවරේද;

(ii) ඒවා අතරින් ක්‍රියාත්මක කිරීමට අනුමත වී ඇති යෝජනා කවරේද;

(iii) එකී අනුමතිය පාදක කරගනු ලබන ආර්ථික විශ්ලේෂණය පිළිබඳ සමීක්ෂණය, (Economic Analysis) රථවාහන ගමනාගමනය පිළිබඳ සමීක්ෂණය (Traffic Survey) හා GPS සමීක්ෂණයේ කොන්දේසි හෝ නිර්ණායක වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) පදවි ශ්‍රීපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ශ්‍රීපුර නගරයට ප්‍රවේශ වීමට ඇති ප්‍රධානම ගම්මැද මාර්ගය වන කිලෝ මීටර් 8ක පමණ දුරකින් යුත් සිංහපුර මාර්ගය මේ යටතේ කාපට් අතුරා සංවර්ධනය කරන්නේද;

(v) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පළාත් සහ රේඛීය අමාත්‍යාංශවලට අයත් මඟී ප්‍රවාහන සේවා ක්‍රියාත්මකවන මාර්ගවල අවම වශයෙන් කොන්ක්‍රීට් හෝ අතුරා නොමැති මාර්ග ගණනාවක් ඇති බැවින්, එම මාර්ග සංවර්ධනය කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

857/'19

ගරු කනක හේරත් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු, කොන්දොස්තර හා කාර්මික මට්ටමේ (PL කාණ්ඩයේ) නිලධාරීන් සංඛ්‍යාව සහ විධායක මට්ටමේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) PL කාණ්ඩයේ නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව වැටුප් ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) PL කාණ්ඩයේ නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදයක් පවතින බව දන්නේද;

(ii) ශ්‍රී ලංගම නිලධාරීන්ට මේ වනවිට උසස්වීම් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම උසස්වීම ලබා දෙන ශ්‍රේණි කවරේද;

(iv) උසස්වීම් ලබා දෙනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අංක 3/2016ට අනුවද;

(v) නොඑසේ නම්, කවර ක්‍රමවේදයකට අනුවද;

(vi) මෙම උසස්වීම් ලබාදීම මඟින් එක් ඩිපෝවකට අමතරව පත්වන විධායක නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

869/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 වර්ෂයේ උසස් අධ්‍යාපනය සඳහා ඉල්ලුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව 30,000 ක් වන අතර එම සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාලවලට ඇතුලත් කර ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) 2017 වර්ෂයේදී දෙහිවල උසස් තාක්ෂණ ඩිප්ලෝමා (HND) ගණකාධිකාරී පාඨමාලාව සඳහා ශිෂ්‍යයන් 180 දෙනෙකු බඳවා ගත් නමුත්, 2018 වර්ෂයේ සිට එම සංඛ්‍යාව 114 දක්වා අඩු කර ඇත්තේ මන්ද;

(iii) මෙලෙස සෑම HND පාඨමාලාවකටම ඇතුලත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව අඩුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශිෂ්‍ය සංගම් පිහිටුවීම සඳහා පෙර පැවති අයිතිය අද වනවිට අහෝසි කර තිබීමට හේතුව කවරේද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙහි (SLIATE) ශිෂ්‍ය සංගම් අයිතිය අහෝසි කර තිබේද;

(iii) ශිෂ්‍ය සංගම් අහෝසි කිරීම නිසා දුක්ගැනවිලි සම්බන්ධයෙන් කවර කටයුත්තක් කළද එය විනය විරෝධී ලෙස සළකා දඬුවම් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

901/’19

ගරු බිමල් රත්නායක මහතා,— රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 නියං සහනාධාර අදියර I යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iii) මෙහි II අදියර සඳහා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් එකම ප්‍රතිලාභියෙක් හෝ තෝරා නොගත් බව දන්නේද;

(iv) එසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රාදේශීය ලේකම්වරයා ක්‍රියාත්මක කර ඇත්තේ අංක NDRSC/2018/03 දරන අවලංගු කරන ලද චක්‍රලේඛය බව පිළිගන්නේද;

(ii) වලංගු චක්‍රලේඛය වන අංක NDRSC/2018/03 ii ක්‍රියාත්මක නොකළේ මන්ද;

(iii) 2018.10.22 දින ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ප්‍රතිලාභීන් නොමැති බව අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාට ලිඛිතව දැනුම් දී ඇත්තේ අවලංගු කරන ලද චක්‍රලේඛයේ 4 වගන්තියේ උපදෙස්වලට අනුකූලවද;

(iv) අවලංගු කරන ලද චක්‍රලේඛයේ 4 වගන්තිය උල්ලංඝනය කර ඇති බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1036/’19

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දිසා අධිකරණ වෙත යොමු වී ඇති පැමිණිලි අතරින් මෙතෙක් විභාග නොවූ සහ විභාග වෙමින් පවතින නඩු තිබෙන්නේ නම්, අදාළ නඩු අංක සහ ඒවා අධිකරණගත වූ දින සමඟ වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(ii) විසඳුමක් නොලැබුණු එකී නඩු අතර වසර 25කට වඩා වැඩි; වසර 20 - 25 අතර; වසර 15 - 20 අතර; වසර 10 - 15 අතර; වසර 05 - 10 අතර සහ වසර 01 - 05 අතර සහ කාලයක් පැරණි නඩු කවරේදැයි අදාළ නඩු අංක හා මුලින්ම ලේඛනගත වූ දින සමඟ වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1039/'19

ගරු විදුර වික්‍රමනායක මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෛනිකව පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ මහජනතාව විශාල වශයෙන් ගැවසෙන හොරණ නගරය සාමාන්‍ය වර්ෂා දිනවලදී පවා ජලයෙන් යට වන බවත්;

(ii) එමෙන්ම හොරණ නගරයේ ශ්‍රී ධම්මරතන මාවත ප්‍රදේශය ඇතුළු තවත් ප්‍රදේශ කිහිපයක් සාමාන්‍ය වර්ෂා දිනවලදී පවා වර්ෂා ජලයෙන් යටවීම හේතුවෙන් එම ප්‍රදේශවල නිවැසියන්ගේ නිවාස, දේපළ සහ ගෘහභාණ්ඩ අවස්ථා කිහිපයකදීම හානියට පත් වූ බවත්;

(iii) හොරණ මූලික රෝහල ආසන්න ප්‍රදේශයද සාමාන්‍ය වර්ෂා අවස්ථාවලදී පවා ජලයෙන් යටවීමෙන් රෝහලට පැමිණෙන රෝගීන්ද මහත් අපහසුතාවයන්ට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත තත්ත්වය පාලනය කිරීම සඳහා හොරණ නගරයේ කාණු පද්ධතිය ක්‍රමවත්ව සකස් කිරීමට ඉක්මනින් පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1048/'19

ගරු අනුරාධ ජයරත්න මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පොළ, උඩපළාත ප්‍රාදේශීය සභාවට අයත් ගලත, මාවතුර, කැකුලන්ද, වැලිගහ හා කලුගල්හින්න යන ප්‍රදේශවල ජනතාව දීර්ඝ කාලයක සිට උග්‍ර පානීය ජල ගැටලුවකින් පීඩා විඳින බවත්;

(ii) මෙම ප්‍රදේශවලට අදාළ ජල ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කර මූල්‍යය පහසුකම් ලබා ගැනීමට ක්‍රියා කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජලය නොමැතිකමින් පීඩා විඳින ඉහත ප්‍රදේශයන්හි ජනතාවට පානීය ජල පහසුකම් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1053/'19

ගරු විමලවීර දිසානායක මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018/2019 මහ කන්නයේදී අම්පාර දිස්ත්‍රික්කයේ, බඩ ඉරිඟු වගාකළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ප්‍රමාණයෙන් සේනා දළඹු හානියෙන් විනාශ වූ වගාබිම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සේනා දළඹු හානිය නිසා විනාශ වූ බඩ ඉරිඟු වගාවන් සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන්ට ගෙවූ මුළු වන්දි ප්‍රමාණය කොපමණද;

(iv) එම වන්දි මුදල එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සේනා දළඹු හානියෙන් විනාශ වූ බඩ ඉරිඟු වගාවන් සඳහා වන්දි නොලැබූ ගොවීන් විශාල සංඛ්‍යාවක් අම්පාර ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක සිටින බව දන්නේද;

(vi) අසාධාරණයට ලක් වූ එම ගොවීන් සඳහා වන්දි ගෙවීමක් සිදු කරන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?